WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** මාධ්‍යවේදිනියක් සමාජ අසාධාරණයට එරෙහිව කරන අරගලය, සිංහලට හඬ කවා විකාශය වන ඉන්දියානු ටෙලි නාට්‍යයක කතා ප්‍රවෘත්තියයි.

(i) ටෙලි නාට්‍යයකින් අපේක්ෂා කරන සන්නිවේදන කාර්යය කුමක් ද?

(ii) ඉහත ටෙලි නාට්‍යය අඩු වියදමකින් නමුත් කොටස් වැඩි ගණනක් සහිත ව විකාශනය වන්නේ නම් එය අයත් ටෙලි නාට්‍ය වර්ගය කුමක් ද?

(iii) විදේශ ටෙලි නාට්‍ය විකාශනය කිරීමේ දී ඍජු රාජ්‍ය මැදිහත්වීමක් පෙන්නුම් කරන ආකාරය කුමක් ද?

(iv) ඉහත නිර්මාණයට සමාන වූවක් මෙරට දී නිෂ්පාදනය කරන්නෙකුගේ ආර්ථික අයිතිය හා සදාචාරාත්මක අයිතිය තහවුරු කෙරෙන ප්‍රධාන නෛතික තත්ත්වය කුමක් ද?

(v) ටෙලි නාට්‍ය ඇසුරෙන් අසන ලද පැනයකට පිළිතුරු ලබා දී ත්‍යාග දිනා ගැනීමට ප්‍රේක්ෂකයෙකු සිතුවේ ය. මෙම සිතුවිල්ල අයත් සන්නිවේදන වර්ගය කුමක් ද?

(vi) අකුණු ගැසීම නිසා ටෙලි නාට්‍ය නැරඹීම අතරමග නවතා දමන්නට සිදුවිය. මෙය කුමන සන්නිවේදන බාධාවක් ද?

(vii) ටෙලි නාට්‍යයේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ විචාරයක් පුවත්පතක පළ වුණි නම් එම ලිපි ආකෘතිය කුමක් ද?

(viii) ටෙලි නාට්‍ය විකාශනය වී, කෙටි කාලයක් තුළ එය සමාජ මාධ්‍යට උඩුගත කරයි. ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය අතර සුසංයෝගවීමේ මෙම සංකල්පය හඳුන්වන යෙදුම කුමක් ද?

(ix) ඉහත ටෙලි නාට්‍යය ගුවන්විදුලි නාට්‍යයක් බවට පත් කිරීමේ දී භාවිත කළ හැකි ප්‍රධාන හඬ වර්ග දෙකක් නම් කරන්න.

(x) ඉහත ටෙලි නාට්‍යයේ මාධ්‍යවේදිනියගේ භූමිකාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී යොදා ගත හැකි සමාජ විද්‍යාත්මක සංකල්පය කුමක් ද?

WWW.OLEVELAPI.COM

**2.** මැතිවරණ සමයේ දී අපේක්ෂකයකු තම මාධ්‍ය ප්‍රචාරණය පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතු ය.

(i) ජනතාව ඇමතීමේ දී තමා ඉදිරියේ සිටින සමූහය සමග අපේක්ෂකයා ඇස් සබඳතා පවත්වයි. මෙම ක්‍රියාව හඳුන්වන යෙදුම කුමක් ද?

(ii) මැතිවරණ කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියට අදාළ තොරතුරු පාදක කාර්ය දෙකක් නම් කරන්න.

(iii) මැතිවරණයට අදාළව ප්‍රවෘත්ති ඡායාරූපයක් ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) මැතිවරණයක දී පෝස්ටර් භාවිතයේ ප්‍රබලතා හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

**3.** පුවත්පත හා ඡායාරූප අතර ඇත්තේ ඉතා සමීප සම්බන්ධයකි.

(i) පළ කෙරෙන වාරය අනුව පුවත්පත් වර්ග දෙකක් නම් කරන්න.

(ii) පුවත්පත් වාර්තාවක් සඳහා තෝරා ගනු ලබන ඡායාරූපයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.

(iii) සමකාලීන විද්‍යුත් පුවත්පත්වල දක්නට ලැබෙන පොදු ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iv) පුවත්පතක නිශ්චල ඡායාරූප යොදා ගැනීමේ වාසි හතරක් වෙන වෙන ම පැහැදිලි කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. සන්නිවේදනයේ ස්වභාවය පැහැදිලි කර ගැනීම සඳහා එහි වර්ග සහ ස්වරූප පිළිබඳ අවබෝධය වැදගත් වේ
   (i) පොදු සංදේශ සහ සංවිධානාත්මක ආයතනයක් යන ලක්ෂණ දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය කුමක් ද?
   (ii) ලිඛිත භාෂාවේ විධිමත් බව පෙන්නුම් කරන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
   (iii) ඵලදායි ලේඛනයක් හඳුනා ගැනීමට උපයෝගී කර ගත හැකි සාධක තුනක් පැහැදිලි කරන්න.
   (iv) 'සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක්' මැයෙන් සංදේශය නමැති සඟරාවට ලිපියක් සම්පාදනය කරන්න.

5. (i) ශ්‍රී ලංකාවේ පළමු පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය කුමක් ද?
   (ii) දේශීය ජනමාධ්‍ය ස්ථාපනය කිරීමේ දී දෙයාකාරයක පනත් මූලික විය. එම පනත් වර්ග දෙක මොනවා ද?
   (iii) ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක දී බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් භාවිත කිරීමේ ප්‍රයෝජන තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iv) ජනමාධ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු සඳහා පහත සඳහන් එක් එක් උපකරණය භාවිත කිරීමේ අවශ්‍යතා දෙක බැගින් වෙන වෙන ම කෙටියෙන් විස්තර කරන්න.
      - දින මුද්‍රා යන්ත්‍රය
      - නිල මුද්‍රා යන්ත්‍රය
      - තැපැල් මුද්‍රා යන්ත්‍රය
      - මුදල් සටහන් යන්ත්‍රය

6. (i) ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යවලට අදාළ ආචාරධර්ම පද්ධතියක් නම් කරන්න.
   (ii) පුවත්පතක පළවූ ලිපියක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා භාවිත කළ හැකි විධික්‍රම දෙකක් දක්වන්න.
   (iii) ජනමාධ්‍යවලින් නව මාධ්‍ය වෙනස් වන ආකාර තුනක් පැහැදිලි කරන්න.
   (iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගත හැකි ප්‍රකාශන විධි දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න.

7. කොවිඩ් 19 වසංගතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක දී වෛද්‍යවරයා විවිධ වාගලංකාර හා භාව ප්‍රකාශන යනාදිය භාවිත කරමින් අර්ථවත් දේශනයක් සිදු කළේ ය.
   (i) ඉහත වාචික සන්නිවේදන අවස්ථාවේ දී වෛද්‍යවරයා භාවිතයට ගෙන ඇති භාෂා අංගය කුමක් ද?
   (ii) ඉහත වසංගත අවස්ථාවට විශේෂිත ගුවන්විදුලි නිවේදනයකට අදාළ කොටස් දෙකක් නම් කරන්න.
   (iii) වසංගත තත්ත්වය පිළිබඳ තොරතුරු රැස් කරන්නෙකු ලෙස ඔබ ඉහත වැඩසටහනට සහභාගි වන්නේ නම්, ඔබ තුළ තිබිය යුතු ගුණාංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.
   (iv) ඉහත වාතාවරණය තුළ දීර්ඝ කාලයක් ළමයින් රූපවාහිනිය නැරඹීමට පෙළඹීම නිසා සිදුවිය හැකි යහපත් හා අයහපත් බලපෑම් දෙක බැගින් විස්තර කරන්න.

WWW.OLEVELAPI.COM

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....